# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/48 /2025 (PSC)

එම්.ඒ.අයි.ෆොන්සේකා
**අභියාචක**
**එදිරිව**
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය :-2026.01.28**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

**-<u>නියෝගය</u>-**

## විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා

අභියාචක විශේෂඥ වෛද්‍ය එම්.ඒ.අයි.ෆොන්සේකා යන අය, 1998.06.01 දින කුලියාපිටිය ශික්ෂණ රෝහලේ වෛද්‍ය නිලධාරිණියක ලෙස රාජකාරි ආරම්භ කර, එම තනතුරෙහි වසර 26කට ආසන්න කාලයක් වෛද්‍ය වෘත්තියේ නියැලී ඇති වෛද්‍යවරියෙකි. ඇය ළමා රෝග විශේෂඥ වෛද්‍ය තනතුරට 2011.09.18 දින පත්වීම ලබා ඇත. ඉන් අනතුරුව 2019.03.15 වෙනි දින නාවලපිටිය දිස්ත්‍රික් රෝහලට ස්ථානමාරු ලබා පැමිණ, එහි සේවයේ නිරතව ඇත. ඇය 2021.08.10 වෙනි දින රාජකාරියේ යෙදී සිටියදී, රෝහල් අධ්‍යක්‍ෂකගේ නිසි අවසරයකින් තොරව, රාජකාරි වේලාවන් තුළ පෞද්ගලික වෛද්‍ය සේවයේ යෙදීම හේතුවෙන්, ඇයට එරෙහිව චෝදනා 03ක් ඉදිරිපත් කර ඇත. එම චෝදනා අතරින් ප්‍රථම චෝදනා දෙකට පදනම් වී ඇත්තේ, අභියාචක නාවලපිටිය දිස්ත්‍රික් මහ රෝහලේ අධ්‍යක්‍ෂකගේ නිසි අවසරයකින් තොරව, නාවලපිටිය සෙන්ටාරා පෞද්ගලික රෝහලට ගොස් පෞද්ගලික වෛද්‍ය සේවයේ යෙදීම මඟින්, සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් නිකුත් කර ඇති 02/99 දරණ පොදු චක්‍රලේඛයේ 07 වන වගන්තියට පටහැනි අයුරින් කටයුතු කර තිබීමයි. 02 වන චෝදනාවද පදනම් වී ඇත්තේ, ඉහත කී සිද්ධිය මතම වන අතර, එය

වැඩිදුරටත් දීර්ඝ කරමින් චෝදනා කර ඇත්තේ, අභියාචක විසින්, ව්‍යාජ සටහන් යොදා තිබීමයි. 03 වන චෝදනාව පදනම් වී ඇත්තේ, ඉහත සඳහන් චෝදනා දෙක මතය.

ඉහත කී චෝදනා මත, අභියාචකට එරෙහිව විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා ඇති අතර, එහි ප්‍රතිඵලය වූයේ, අභියාචක චෝදනා තුනටම වරදකරු බවට පත්කර තිබීමයි. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින්, විනය පරීක්ෂණයේ තීරණය පදනම් කර ගනිමින්, විනය නියෝගයක් වශයෙන් අභියාචකගේ වැටුප් වර්ධක දෙකක් විලම්භනය කර ඇත. එම තීරණයට එරෙහිව අභියාචක විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් අභියාචක දෙවන චෝදනාවෙන් නිදහස් කර ඇත. අභියාචක දෙවන චෝදනාවෙන් නිදහස් කර ඇති නිසා, අභියාචක වෙත පනවා තිබූ විනය නියෝගය සංශෝධනය කරමින්, වැටුප් වර්ධක දෙකක් විලම්භනය කිරීම වෙනුවට, වැටුප් වර්ධක එකක් විලම්භනය කරමින් නියෝගයක් ලබා දී ඇත. එකී විනය නියෝගයට එරෙහිව අභියාචක විසින් මෙම විනිශ්චය අධිකාරය වෙත 2025.02.21 දින මෙම අභියාචනා පෙත්සම ඉදිරිපත් කර ඇත. ඒ මගින් අභියාචක ඉල්ලා ඇත්තේ ඇය වෙත ලබා දී ඇති දඩුවම ඉවත් කර දෙන ලෙසයි.

ඉහත සඳහන් කරුණු අනුව මේ අවස්ථාවේදී තීරණය කළ යුතු වන්නේ, අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ පළවන චෝදනාවට ඇය වරදකරු බවට පත්කර තිබීම නිවැරදිද යන්නයි. පළවන චෝදනාව සනාථ කිරීමට නම්, ප්‍රධාන වශයෙන් සනාථ කළ යුතු වන්නේ, අභියාචක විසින් සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති 02/99 දරණ පොදු චක්‍රලේඛයේ 07 වන වගන්තිය කඩකර තිබේද යන්නයි. එකී 07 වන වගන්තිය පහත සඳහන් වේ.

> **"විශේෂඥ වෛද්‍යවරුන් හට බරපතල ලෙස රෝගාතුරව සිටින පෞද්ගලික රෝගියෙකුට හදිසි තත්ත්වයක් යටතේ තම සාමාන්‍ය රාජකාරි වේලාව තුළ ප්‍රතිකාර කිරීමට අවසර ලැබෙන නමුත්, එසේ කළ හැකි වනුයේ එවැනි සේවාවක් ලබා ගැනීම සඳහා අදාළ රෝහලින් කරන ලද ඉල්ලීමක් මත ආයතන ප්‍රධානියාගේ පූර්ව ලිඛිත අවසරය ලබාගැනීමෙන් පසුවය. ආයතන ප්‍රධානියා විසින් මේ සඳහා තම කාර්යාලයේ ලේඛනයක් පවත්වා ගෙන යා යුතු අතර,**

**අමාත්‍යාංශ නිලධාරීන් විසින් පරීක්ෂණ සඳහා ඉල්ලා සිටි විටක එය වහාම ලබාදිය යුතුය.**"

අභියාචක විසින් පෞද්ගලික රෝහලක ප්‍රතිකාර ලබමින් සිටි රෝගියෙකුට, ඇයට නියමිත සාමාන්‍ය රාජකාරී කාලය තුළ, ප්‍රතිකාර කර ඇති බව විවාදයෙන් තොරව පිළිගෙන ඇත. එසේ නම් මීළඟට තීරණය කළ යුතු වන්නේ එසේ පෞද්ගලික රෝහලක සේවය සඳහා, අභියාචක විසින් ආයතන ප්‍රධානියාගේ පූර්ව අවසරයක් ලිඛිතවම ලබාගෙන තිබේද යන්නයි. සාක්ෂි ඉදිරිපත් වන ආකාරයට අභියාචක විසින් සේවා ස්ථානයෙන් බැහැරව යාම සිදුකර ඇත්තේ, ඇය එදින එනම්, 2021.08.10 දින පෙ.ව.11.30ට පමණ රෝහල් අධ්‍යක්ෂකවරයාගේ කාමරයේ පැවති රැස්වීමකට සහභාගී වීමෙන් අනතුරුවය. එම රැස්වීමට අභියාචක ඇතුළු විශේෂඥ වෛද්‍යවරුන් 10 දෙනෙකුට ආසන්න සංඛ්‍යාවක් සහභාගී වූ බවට සාක්ෂි ඉදිරිපත් වේ. එම අවස්ථාවේ දී ලැබුණ දුරකථන පනිවිඩයක් මගින්, නිලක්ෂි රාජදුරෙයි යන අය, දරු ප්‍රසූතියට ආසන්නයේ දරුවා හිරවීමකට ලක්වී තිබීමත්, දරුවාගේ ශබ්දය අඩුවෙමින් පවතින බවටත්, දුරකථනයෙන් අභියාචක වෙත දැනුම් දීමත් හේතුවෙන් ඇය මෙම ස්ථානයෙන් පිටත්ව ගොස් ඇත.

අභියාචක ප්‍රකාශ කර ඇත්තේ, එම අවස්ථාවේ එම ස්ථානයේ සිටි රෝහල් අධ්‍යක්ෂක වෙත, ඇය වාචිකව දන්වා, දහවල් 12.30ට පමණ රෝහලෙන් බැහැරව යන ලද බවයි. එයින් පෙනී යන්නේ, අභියාචක සේවා ස්ථානයෙන් බැහැරව යාමට ලිඛිත අවසරයක් ලබාගෙන නොමැති බවයි. එසේ නම් එයට හේතුව කුමක්ද යන්නත්, ඇය විසින් කුමන අන්දමේ අවසරයක් ලබාගෙන තිබේද යන්නත් පරීක්ෂා කර බැලිය යුතුය.

ලිඛිත අවසරයක් ලබා ගැනීම සඳහා අවශ්‍ය ලේඛනයක් මෙම රෝහලේ පවත්වා ගෙන ගොස් නොමැති බවට කරුණු ඉදිරිපත් වී ඇත. එසේ නම් අභියාචකට කිසියම් ලේඛනයක සටහන් කරමින් සේවා ස්ථානයෙන් බැහැරව යාමට හැකියාවක් නැත. එම කරුණු සළකා බලා, අභියාචක දෙවන චෝදනාවෙන් නිදහස් කර ඇති බව පෙනී යයි.

මෙම සිද්ධිය සම්බන්ධයෙන් රෝහල් අධ්‍යක්ෂක සෝමරත්න යන අයගේ සාක්ෂිය වැදගත්වේ. ඔහු සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ 2021.08.10 දින ඔහුගේ ප්‍රධානත්වයෙන් රෝහලේදී රැස්වීමක් තිබුණාද යන්න ඔහුට මතකයක් නොමැති බවයි. නමුත් ඒ සම්බන්ධයෙන් විශේෂඥ වෛද්‍යවරයෙකු වන රොෂාන් ඉන්දික සිරිවර්ධන යන අය සහ අභියාචක සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ, එදින රෝහල් අධ්‍යක්ෂකගේ

ප්‍රධානත්වයෙන් රැස්වීමක් පැවැත්වූ බවයි. රෝහල් අධ්‍යක්ෂක ඔහුගේ සාක්ෂියේ දී ප්‍රථමයෙන් මෙම සිද්ධිය වූ දින රැස්වීමක් පැවැත්වූ බවට මතකයක් නොවූ බවට සඳහන් කර ඇතත්, පසු අවස්ථාවක එය වෙනස් කරමින් එදින එවැනි සාකච්ඡාවක් පැවති බවට ප්‍රකාශ කර ඇත. (ඒ සඳහා සාක්ෂි සටහන් වල 4 සහ 5 පිටු බලන්න) රෝහල් අධ්‍යක්ෂකවරයාගෙන් අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් ඔහු ප්‍රකාශ කර ඇත්තේ, ඉහත කී චක්‍රලේඛය අනුව විශේෂඥ වෛද්‍යවරුන් සඳහා ලේඛනයක් පවත්වා ගෙන යාමේ වගකීම ආයතන ප්‍රධානියාට පැවරුනත්, ඔහුට පෙර සිටි අධ්‍යක්ෂකවරුන් එවැනි ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොමැති නිසා, ඔහුගේ කාල පරිච්ඡේදය තුළදීද එවැනි නාම ලේඛනයක් පවත්වා ගෙන නොගිය බවයි.

ඉහත සාක්ෂි අනුව පෙනී යන්නේ රෝහල් අධ්‍යක්ෂකවරයාගේ සාක්ෂිය පිළිගනිමින් කටයුතු කිරීම නොකළ යුතුව තිබුණ බවයි. ඔහු විසින් ඔහුගේ සාක්ෂිය වරින්වර වෙනස් කරමින් සාක්ෂි දී ඇති බවද පෙනී යයි. ඒ අනුව අභියාචක විසින් ලබා දී ඇති සාක්ෂිය පිළිගැනීමට සිදුවේ.

ඉහත කරුණු සළකා බැලීමෙන් අනතුරුව පෙනී යන්නේ අසාධ්‍ය තත්ත්වයේ සිටි රෝගියෙකුගේ දරු ප්‍රසූතියක් ආසන්නයේ, ලැබීමට ගිය දරුවාගේ සෞඛ්‍ය තත්ත්වය පිරිහීම නිසා, අභියාචක එම ස්ථානයට ගොස් ඇති බවයි. එසේ යාමේ දී අදාළ චක්‍රලේඛය අනුව අවසරයක් ලබාගත යුතුව තිබුණත්, එම චක්‍රලේඛය සඳහා අවශ්‍ය ලේඛනයක් පවත්වා ගෙන ගෙස් නොමැති නිසා, අභියාචක විසින් ඒ පිළිබඳව වාචිකව අධ්‍යක්ෂකවරයා වෙත පවසා ඇති බව පෙනී යයි. ඒ අනුව පැහැදිලි වන්නේ, අභියාචක විසින් නිසි අවසරයක් ලබා ගැනීමෙන් අනතුරුව, මෙම කාර්ය සඳහා සේවා ස්ථානයෙන් බැහැරව ගොස් ඇති බවයි. එසේ නම් අභියාචක පළවන චෝදනාවට වරදකරු බවට පත්කිරීම නිවැරදි නොවේ. ඒ අනුව අභියාචකට එරෙහිව ඉදිරිපත් කර ඇති ප්‍රථම චෝදනාවෙන් ඇයව නිදහස් කළ යුතු බවට තීරණය කරමු.

දෙවන චෝදනාවෙන් දැනටමත් ඇය නිදහස් කර ඇති නිසා, එකී චෝදනා දෙක මත රඳා පවතින තුන්වන චෝදනාවෙන් ද අභියාචක නිදහස් කළ යුතු බවට තීරණය කරමු.

ඉහත හේතුන් සළකා බලා අභියාචක වෙත ඉදිරිපත් කර තිබූ සියලුම චෝදනා වලින් අභියාචක නිදහස් කිරීමටත්, ඒ අනුව ඇය වෙත පනවා ඇති දඬුවම ඉවත් කිරීමටත් තීරණය කර, නියෝග කරමු.

ඉහත හේතූන් සළකා බලා අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනයට ඉඩදෙමු.

මෙම නියෝගය ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව ඒ බව මෙම විනිශ්චය අධිකාරය වෙත දැනුම් දෙන ලෙසට ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දැනුම් දෙමු.

මෙම නියෝගයන් ක්‍රියාත්මක කිරීමට සුදුසු පියවර ගන්නා ලෙසට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දැනුම් දීමට විනිශ්චය අධිකාරයේ ලේකම්වරයා වෙත නියෝග කරමු.

අභියාචනයට අවසර ලබාදෙමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

(ජේ.ජේ.රත්නසිරි)
(සාමාජික)

මම එකඟ වෙමි

(එස්.නන්දසේකරන්)
(සාමාජික)

ලලිතා/-